බදුල්ල අධ්‍යාපන කලාපය

# සිංහල භාෂාව හා සාහිත්‍යය තරගාවලිය. 2018

6 ශ්‍රේණිය

## සාහිත්‍ය දැනුම මිනුම

නම :-.................................................................................................... කාලය :- පැය 02 යි.

පාසල :-........................................................................................ පාසල් වර්ගය :- 200 තෙක් / 201-500 තෙක් /500 ට වැඩි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

(01). පෙළපොත ඇසුරෙන් ලැබූ දැනුමෙන් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| ප්‍රකාශය | ප්‍රකාශය ඇතුලත් පාඩම | කවුරුන් විසින් කියන ලද්දක් ද ? | කා හට කියන ලද්දක් ද ? |
|---|---|---|---|
| 1 " හනික හනික බලා ඉන්ට කල් නෑ. අප හැම ම බඩගින්නේ " | | | |
| 11 " දරුවනි පැන් නො බොව් දැ'යි කිවුය " | | | |
| 111 " ඉතිං දැන් නැගිටින්න. දෙඇස් පිහ ගන්න. " | | | |
| 1v " ඈ අප්පේ කාට දැ කුමක්ද ඔය තඩේ ගෙනියන්නනේ " | | | |
| v " එහෙනම් ගිහින් හොයාගන වරෙල්ලා. අපි මෙහෙම ඉන්නම් " | | | |

(ලකුණු. 3×5= 15)

(02). නිවැරදි වරණය තෝරා ඉරක් අඳින්න.

1. ඒ.පී.ගුණරත්න විසින් රචිත ග්‍රන්ථයකි.
   1. විද්‍යා විනෝද කතා 11. කියවන නුවණ 111. වටු කිරිල්ලී හා තවත් කතා 1v. අපේ ගම

11. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි රචනා කළ කාව්‍ය ග්‍රන්ථයක් වනුයේ,
   1. කාව්‍යශේඛරය 11. ගුත්තිල කාව්‍ය 111. කව්සිළුමිණ 1v. හංස සන්දේශය

111. පන්සිය පනස් ජාතක පොත ලියවුණු රාජධානි සමය වනුයේ,
   1. කෝට්ටේ 11. කුරුණෑගල 111. මහනුවර 1v. ගම්පොල

1v. " රත්නදීප ජන්ම භූමි " ගීතය නිර්මාණය කරනු ලැබුවේ,
   1. කුමාරතුංග මුනිදාස මහතා 11. මහින්ද හිමි 111. මහගමසේකර මහතා 1v. අරිසෙන් අහුබුදු සූරි

v. කොතරම් බිහිසුණු තත්වයක දී වුවද තම ආශාව ඉටුකර ගන්නා බව හැඟවෙන ප්‍රස්ථා පිරුල වන්නේ,
   1. ගඟට ඉනි කැපුවා වගේ 11. ඇටි කෙහෙල් කාපු උගුඩුවා වාගේ
   111. මරණ තුනක් ඇති මිනිහෙක් පැණි කෑවා වගේ 1v. කටුස්සාගේ කරේ රත්තරං බැන්දා වගේ

(ලකුණු 2×5= 10)

(03). පෙළ පොතෙන් උපුටාගෙන ඇති පහත සඳහන් කවිවල ඉතිරි පද සම්පූර්ණ කරන්න.

1. ඉර උදා වන්නට

..........................................................................................

..........................................................................................

..........................................................................................

11. හිස අවුල් කරගෙන

.....................................................................................

.....................................................................................

.....................................................................................

111. වැස්ස වගේ ආකාසෙන් වහින්න මං ආසයි

...............................................................................................

...............................................................................................

............................................................................................... (ලකුණු 3×5= 15)

(04). පහත දැක්වෙන ප්‍රකාශ හරි නම් (✓) ලකුණද වැරදි නම් (×) ලකුණද යොදන්න.

1. සිරිත් මල්දම ඇම්.එල්.සිල්වා ගුරු මුහන්දිරම්තුමාගේ කෘතියකි. ☐
11. ඇස්. මහින්ද හිමි විසිවන සියවසට අයත් ලේඛකයෙකි. ☐
111. හත්පණ කුමාරතුංග මුනිදාස මහතාගේ කෘතියකි. ☐
iv. බෝසත් මුවකුගේ චරිතයක් නලපාන ජාතකයෙන් ඉස්මතු කරයි. ☐
v. ජාතක කතා පොතෙහි ඇතුළත් කතා ගණන 555 කි. ☐

(ලකුණු. 2×5= 10)

(05). පහත දැක්වෙන පදවල අර්ථය ලියන්න.

| | | | |
|---|---|---|---|
| 1. අතුල් තල | - ......................................... | vi. ජඹුර | - ................................................ |
| 11. ඉඳිකටු කුළා | - ......................................... | vii. ඉඩෝරය | - ................................................ |
| 111. ඒකරන්ඩු | - ......................................... | viii. අනාදිම ත්කාලයක් | - ................................................ |
| 1v. කෙළෙනා | - ......................................... | ix. පාදයෝ | - ................................................ |
| v. ඩැහැ ගත්තා | - ......................................... | x. සමෘද්ධ වන්නේය | - ................................................ |

( ලකුණු. 2×10= 20 )

(06). පහත සඳහන් කවි කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

වැඩකට නෙයෙදූ සිත
නරක අතට ම පෙරළෙත
කිමෙක වන යහපත
වැඩක එබැවින් යොදනු තම සිත

ඇඟ වැසුමෙන් නිසි ඇඳුම් අඳින්නේ
බඩ නෙරුමෙන් රෙදි ඇඳ නොම ගන්නේ
හිස වැසුමෙන් කිසි තැන නොවදින්නේ
සුදුසු තැනින් නිසි ලෙස පලයන්නේ

අනුන්ට බුහුමන් දී සලකන්නේ
තමන්ට බුහුමන් ලැබෙයි එයින්නේ
අනුන්ට තම වංශය කියමින්නේ
ලබන්ට නම්බුව නොසිතාපන්නේ

1. මෙම කවිවලින් කියැවෙන්නේ කුමක් පිළිබඳව ද?

11. පළමු කවියට අනුව නරක අතට සිත පෙරළෙන්නේ කුමක් නිසාද?

111. ඇඳුම් ඇඳීම පිළිබඳ ව දෙවන කවියෙන් කියවෙන කරුණු දෙක දක්වන්න.

Iv. තෙවැනි කවියට අනුව තමන්ට බුහුමන් ලැබෙන්නේ කුමක් කිරීමෙන් ද?

v. මෙම කවි පෙළ උපුටාගෙන ඇත්තේ කුමන උපදේශාත්මක කෘතියෙන් ද?

( ලකුණු. 2×5= 10 )

(07). පහත ගද්‍ය කොටසේ අදහස ලිහිල් බසින් ලියන්න.

1. තවද එක් සමයෙක්හි දෙව් බඹුන් මුදුනෙහි කෙළෙනා පා පියුම් ඇති ලෝකස්වාමි වූ සර්වඥයන් වහන්සේ කොසොල් දනව්වෙහි සැරිසරා ඇවිදිනා සේක් නලපාන නම් ගමට පැමිණ නලපාන පොකුණ සමීපයෙහි වූ වැටකේ වනයෙහි වසන සේක් බට දඬු අරභයා මේ ජාතකය වදාළ සේක. එසමයෙහි භික්ෂූන් වහන්සේ නලපාන නම් පොකුණෙන් පැන් සනහා ඉඳිකටු කුළා නිසා සාමනේරයන් වහන්සේ ලවා බට දඬු කප්පවා ගෙන්වා ගෙන ඒ සියලු බට දඬු ගැට නැතිව ඒකච්ඡිද්‍රව දිගටම සිදුරු නියාව දැක බුදුන් කරා ගොස් " ස්වාමීනි අපි ඉඳි කටු කුළා නිසා බට දඬු ගෙන්වුම් හ. "

( ලකුණු. = 20 )